# ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි !

ධම්කාමී පින්වතුනි,

අද ශ්‍රී ශුද්ධ බුද්ධ පරිනිර්වාණ වර්ෂ 2558 වැන්නෙහි වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයයි. කිතුවසින් 2014 ක්වූ මැයි මසට යෙදුනු පුරපෝ දිනයයි. මහබෝසතුන් වහන්සේ මවුකුසින් බිහි වීම, බුදු වීම, පිරිනිවීම, කිඹුල්වත් පුරට වැඩ යමාමහ පෙළහර පා ශාක්‍යාභිමානය බිඳීම, සමනළ කඳු මුදුනෙහි සිරිපා සටහන තැබීම, විජය කුමරු ලක්දිව පැමිණීම, දෙවන පෑතිස් රජු දෙවෙනි වර අභිෂේක කිරීම, රුවන්වැලි මහසෑ රජුන්ගේ වැඩ ආරම්භ කිරීම වැනි විශේෂ සිදුවීම් සිහිපත් කරන දිනයයි.

අද බෞද්ධ ලෝකයාගේ අසහාය (වෙනත් දිනයන්ට සමාන කල නොහැකි) දිනයයි. මෙදින බොහෝ ශ්‍රද්ධාවන්තයෝ බුදුරජාණන් වහන්සේ පිළිබඳ සැදැහැ උපදවා ආමිස ප්‍රතිපත්තීන්හි පිහිටා දවස ගෙවති. ඒ සඳහා අරමුණු ඇතිකර ගැනීමට උපකාර වශයෙන් මෙම දහම් පණිවුඩයට මාතෘකා කරගත්තේ සූත්‍ර පිටකයෙහි මැදුම් සඟියෙහි ගහපති වග්ගයෙහි උපාලි සූත්‍රයයි. මේ සූත්‍රය දේසනා කරන විට භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ නාලන්දා නුවර, නාලන්දා ගමේ පාවාරික නම් සිටුවරයාගේ අඹ වනයේය. මේ කාලයේ නාලන්දාව සහ විශාලාව පුරා තම දුෂ්කර ආගමික ප්‍රතිපත්තියට බොහෝ මිනිසුන් පහදවාගෙන තම ශ්‍රාවක පිරිස සමග නිගන්ඨනාත පුත්ත නම් ශාස්තෘවරයා සිටිය කාලයයි. මේ සූත්‍රයෙන් අපිට ඉගෙන ගත හැකි වැදගත්ම පණිවුඩය වන්නේ අපේ ශාස්තෘන් වහන්සේ අදවැනි දිනක සම්බුද්ධත්වයට පත්ව උන්වහන්සේ ලෝකයට ලබා දීපු නිරවුල් නිවැරදි සත්‍ය ධර්මය කොතරම් විශ්මිතද යන්න තේරුම් ගැනීමත් ඒ සඳහා අපි පළමුවෙන් කළයුතු උවමනාම කාර්‍යය වන සිත පහදවා ගැනීමේ වටිනාකම අවබෝධ කර ගැනීමත්ය.

මේ දේසනාවට හේතුවන කථාව හරිම ලස්සනයි. ඉහත කී නිගණ්ඨනාථ පුත්ත හෙවත් ජෛනමහාවීරගේ ගෝලයෙක් හිටියා දීඝ තපස්වී කියලා. ඒ අයත් ජීවත් වෙලා තියෙන්නෙ පිණ්ඩපාතිකව නිසා පිණ්ඩපාතයෙන් පසු ඔහු අඹවනයට ගියා. එහිදී භාග්‍යවතුන් වහන්සේ දැක පිළිසඳරෙ යෙදුණා. බුදුහාමුදුරුවෝ දීඝතපස්වීගෙන් අහනව. නිගණ්ඨනාත පාපකර්ම සිදුවීමට හා ඒවා පැවැත්මට කර්ම කීයක් ගැන දේසනා කරනවද යනුවෙන්. තපස්වී උත්තර දෙනව. ඇවැත් ගෞතමයෙනි ! නිගණ්ඨනාතයන් හට කර්ම කර්ම කියලා පුරුදු නැහැ. දණ්ඩ දණ්ඩ කියලා තමයි පුරුදු. ඉතින් දණ්ඩ කීයක්ද? ඒ තමයි කාය දණ්ඩ, මනෝ දණ්ඩ, වචී දණ්ඩ යනුවෙන්. එවිට බුදුහාමුදුරුවෝ අහනව. එයින් බරපතල කුමක්ද කියල. ඊට උත්තර දෙනව මේ තුනෙන් බරපතල කාය දණ්ඩය කියලා. බුදුහාමුදුරුවෝ තුන්සැරයක් ඒ උත්තරමයද කියා අහල ඔහු ලවා තහවුරු කරගත්ත.

ඉන්පසුව තපස්වී බුදුරජාණන් වහන්සේගෙන් අහනව. ඇවැත් ගෞතමයෙනි !, තමුන් වහන්සේ කර්මයන් කිරීමට ඒවා පැවැත්මට දණ්ඩ කීයක් පනවනවාද? බුදුහාමුදුරුවෝ කියනව තපස්වී ඉහත කී කාය, වචී, මනෝ යන කර්ම තුනයි. එයින් මහා බරපතල වන්නේ මනෝකර්මයයි. එවිට තපස්වී අහනව ඒවා වෙන වෙනම කර්ම ලෙස පනවනවාද යනුවෙන්. බුදුහිමියන්ද ඒ පරිදිම පැවසුව. ඔහුගෙන් බුදුහිමි අහපු විදිහටම ඔහුද අහල තුන්සැරයක්ම සම්මත කරගත්ත. එයද දැනගෙන තපස්වී එතනින්

නිගණ්ඨනාත පුත්ත ළඟට පිටත් වුනා. ඒ සිදුවූ සියල්ල පවසන විට එතන හිටිය, උපාලි ගෘහපති නම්වූ නිගණ්ඨනාත පුත්තගෙ ප්‍රධාන දායකයාද සමග අනුගාමික මහා පිරිසක්. උපාලි හොඳ නිර්භීත ඍජු කෙනෙක්. යමක් තේරුම්ගත හැකි කෙනෙක්. ඒත් ඔහු බෞද්ධ නෙවි ඔහු දීඝ තපස්වීට වැඳගෙන කියනව සාදු ! සාදු !! ලෝකයේ පාපකර්ම කිරීමට සහ පැවැත්මට ලාමක මනෝ දණ්ඩයට වඩා ගොරෝසු කාය දණ්ඩය බලවත් වෙන බව. තමුන්වහන්සේ හොඳ දැන උගත් ශ්‍රාවකයෙක් වශයෙන් ශ්‍රමණ ගෞතමට හොඳ පිළිතුරක් දීලා තියෙනව. උපාලි එහෙම කියා නිගණ්ඨනාත පුත්තට වැඳ පොරොන්දු වෙනව මමද ගිහිල්ලා ශ්‍රමණ ගෞතමයන් වාදයකට පටලවා පරාජයට පත් කරන බවට. ඒ පිළිබඳව උපමා තුනක් කියනවා. බුදුහිමියන් වෙහෙසන විදි. ජෛන මහාවීර සතුටු වුනා. ඒත් දීඝතපස්වී ඒ තීරණයට අප්‍රසාදය පලකලා. ශ්‍රමණ ගෞතමයා අන්‍ය ආගමික දායකයො මායාවකින් තමන්ට වශී කරගන්නව කියල. ඒත් උපාලි ගෘහපති බුදුහිමි සමග වාදයට ගියා මහත් අභිමානයකින් තථාගතයන් වහන්සේට හොඳ පාඩමක් උගන්වමියි යන වැරදි චේතනාවෙන් ගමන පිටත් වුනා.

උපාලි ගෘහපති නිගණ්ඨනාත පුත්‍රයන්ට වැඳ පැදකුණු කොට අවසර ගෙන පාවාරික අඹ වනයෙහි වැඩ වසන බුදුහිමියන් වෙත පැමිණිය. කලින් පැමිණි තපස්වී පිළිබඳවත් ඔහු සමග කරන ලද කථාවන් ද සිහිපත් කොට වාදය ආරම්භ කරනව. මනෝදණ්ඩය හෙවත් මනසින් සිදුකෙරෙන කම් බරපතල නොවන බවත් කයින් කෙරෙන කම් මහා සාවද්‍ය බවත් උපාලි ගෘහපති පිළිගන්නව. පව්කම් කිරීමට හා පැවැත්මට මහත්වූ කාය දණ්ඩය සඳහා ලාමක වූ මනොදණ්ඩය කෙසේ ගැලපෙනවාදැයි බුදුහිමියන්ට අභියෝග කරනව. එවිට බුදුහාමුදුරුවෝ උපාලි ගෘහපතිට කියනව "ගෘහපතිය ! සත්‍යයෙහි පිහිටා කථා කරන්නේ නම් වාදයට එකඟවෙමි" යි පොරොන්දු කරවා ගත්තේය.

උපමා තුනකින් බුදුහාමුදුරුවෝ උපාලි ගෘහපතිගෙන් විමසනව. ගෘහපතිය, අන්තගාමීව නිගණ්ඨයින් සතුන් ඇතැයි උන් මැරෙතියි බියෙන් ඇල්දිය ප්‍රතික්ෂේප කරනව. උණුදිය පාවිච්චි කරනව. ඔවුන්ගෙන් කෙනෙක් ඇල්දිය ප්‍රතික්ෂේප කිරීම නිසා දැඩිසේ ගිලන්වෙනව කලුරිය කරනව නිගණ්ඨ දහමට අනුව ඔහුට කොතැන උප්පත්තියක් වේද? උපාලි උත්තර දෙනව "මනෝ සත්තා" නම් දිව්‍ය ලෝකෙ උපදිනව. වතුර සම්බන්ධව සිත බැඳිලා තියෙන වෙලාවක ඔහු මැරුණ නිසා එහි උපදින බව පැවසුව. බුදුහිමියන් කියනව උපාලි ! කල්පනාවෙන් සත්‍යයෙහි පිහිටලා උත්තර දෙන්න. කලින් කියන වචනයට දැන් කියන වචනය ගැලපෙන්නෙ නැහැ මනෝ කර්මය නේද දැන් ඔබ කියන විදියට මුල්වෙන්නෙ. කාය දණ්ඩය නෙවේ නේද ඔබ ප්‍රතික්ෂේප කරන ලද මනෝ දණ්ඩය මුල්වී නේද මනෝ සත්තා නම් දිව්‍ය ලෝකෙ ඔබ කියන විදියට උපදිතියි උත්තර දෙන්නෙ.

ඊළඟ උපමාවෙන් බුදුහාමුදුරුවෝ උපාලිගෙන් විමසනව. ගෘහපතිය නිගණ්ඨනාත පුත්‍රයන් ප්‍රාණඝාතයෙන් වෙන් වීමේ සංවර 04ක් උගන්වනව. 1. සිහිල් ජලයෙන් වෙන්වී සිටීම. 2. සියලු පවින් වැලකී සිටීම. 3. සියළු පවු දවා හැරීම. 4. සියළු පවු දවා හැරි බවට ස්පර්ශයෙන් යුක්ත වීම. එනමුත් ඔබ අදහන නිගණ්ඨ දහමේ නැවත කියනව. ඇවිදින විට පයට පෑගිමෙන් කුඩා සතුන් මැරෙන්න පුලුවන් කියල එහි විපාක කොහොමද නිගණ්ඨනාත පුත්‍ර පනවන්නෙ කියල බුදුහාමුදුරුවෝ උපාලිගෙන් විමසනව. ස්වාමීනි ! එහෙම අවස්ථාවට චේතනාව නැති නිසා මහා බරපතලයි කියා කියන්නෙ නැහැ. බුදුහාමුදුරුවෝ නැවත අහනව "චේතනාව තිබුනොත්"? එහෙම වුනොත් බරපතලයි".

එහෙනම් උපාලි නිගණ්ඨනාත චේතනාව පනවා තිබෙන්නෙ කුමන දණ්ඩයටද? ස්වාමීනි ! මනෝදණ්ඩයටයි. එවිට බුදුහිමි, ගෘහපතිය ! සත්‍යයේ පිහිටලා කල්පනාවෙන් උත්තර දෙන්න. මුලදී කීව වචනය දැන් බොරු නේද? කායදණ්ඩයට වඩා මනෝදණ්ඩය බරපතල ලෙසට දැන් ඔබට කියන්න වුනා නේද? ඒ වුනාට ස්වාමීනි මට නම් දැනෙන්නෙ කාය දණ්ඩය අනිත් දෙකටම වඩා බරපතල ලෙසටයි.

බුදුරජාණන් වහන්සේ ඊළඟ උපමාව කියනව. ගෘහපතිය ! එහෙනම් මෙහෙම හිතන්න කාය කර්‍ම බරපතල නම් මේ නාලන්දාවේ ඉන්න විසාල වූ ජනගහනය එක් පුරුෂයෙකුට ක්ෂණයකින් කඩුවෙන් පෙති ගහන්න පුළුවන්ද? ස්වාමීනි එක් මිනිසෙකුට නෙවෙයි සියයකටවත් ක්ෂණයකින් එය කරන්න බැහැ.

ගෘහපතිය, සෘද්ධි බල ඇති සෘෂිවරයෙක් හරි මහණ බමුණෙක් හරි පැමිණ මනසින් සාපකොට එක ශාපයකින් මේ නාලන්දාව අළු කරන්න හැකිද? ස්වාමීනි එක නාලන්දාවක් නොව ඊට වැඩියෙන් වුවද අළු කිරීමට හැකිය. ගෘහපතිය ඔබ සත්‍යයේ පිහිටලා නෙවෙයි නේද කථා කරන්නෙ. කායදණ්ඩයට වඩා මනෝ දණ්ඩය බරපතල බව දැන් ඔබ පිළිගන්නව නේද. කල්පනාවෙන් උත්තර දෙන්න. ස්වාමිනි ! ඔබ වහන්සේ මෙහෙම කිව්වත් පව්කම් කිරීමට පැවැත්මට කායදණ්ඩයම මහා සාවi වෙයි. වාග් දණ්ඩයත් මනෝ දණ්ඩයත් එහෙම නෙවෙයි. ඕලාරිකයි කියලයි මට හිතෙන්නෙ කියා උපාලි ගෘහපති කියනව.

ඊළඟ උපමාව බුදුහාමුදුරුවෝ ගෙනහැර දක්වනව. ඔබ අහල තියෙනවද දණ්ඩක, කාලිංග, මේධ්‍යා, මාතඞ්ග යන වනාන්තර මේ තත්වයට පාලු ශූන්‍ය බවට පත්වෙලා තියෙන්නෙ ඇයි කියල. ඔව් ස්වාමීනි ! මේවා ඔක්කොම වනාන්තර වුනේ සෘෂි වරුන්ගේ සාප වලින්. ගෘහපතිය ! කල්පනාවෙන් උත්තර දෙන්න. කලින් කියපු වචනයට දැන් දෙන උත්තරය ගැලපෙන්නෙ නැහැ. මුලදීම ඔබ සත්‍යයේ පිහිටල කථාකරනව කීවා නේද?

ස්වාමීනි ! මම පළමු උත්තරයෙන්ම පැහැදුනා. නමුත් මේ ලස්සන පැහැදිලි කිරීම් මේ ලස්සන උපමා මේ විස්තර අහන්න මට ආසා ඇතිවුනා. ඒ නිසයි මම කිව්වෙ කාය දණ්ඩ හෙවත් කාය කර්‍ම පව්කම් කිරීමට සහ පැවැත්මට හේතු වෙනවාය. මනෝ කර්‍ම ලාමකයි කියල. ඒ වුනත් මට අවබෝධ වුනා මනෝ කර්‍මයම බලවත් වන බව ඔබ වහන්සේගේ විචිත්‍ර ප්‍රතිභාව අහගන්නයි මම ආයෙ ආයෙත් එහෙම නිගණ්ඨනාත මතයම කීවේ.

ස්වාමීනි ! යහපති මට අවබෝධයි. මම ඔබවහන්සේ සරණ යනව. ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්‍මයද ඒ ශ්‍රාවක සංඝ රත්නයද සරණ ගිය කෙනෙකු ලෙස පිළිගන්න කියා ඉල්ලා හිටිය. බුදුහිමියන් පවසනව උපාලි! ඔබ වගේ ප්‍රසිද්ධ කෙනෙක් ඔය වගෙ තීරණ එකපාරටම ගන්න එක හොඳ නැහැ. තවදුරටත් හිතන්න. ඔබගේ නිවස නිගණ්ඨ පිරිසට පැන් පොකුණක් වගෙයි. තවදුරටත් ඒ සැලකීම කරන්න. ස්වාමීනි ! ඒ කථාවෙන් මම තවදුරටත් පැහැදුනා. අද පටන් පළමුවත් දෙවනුවත් තුන්වෙනුවත් තෙරුවන් සරණ යමියි කියා නමස්කාර කළා.

බුදුරජාණන් වහන්සේ තේරුම් ගත්තා උපාලි ගෘහපති දැන් හොඳ චිත්ත ප්‍රසාදයකිනුයි ඉන්නෙ කියල. පිළිවෙලින් දාන, සීල, සුගති උප්පත්ති, කාම ආදීනව, කෙළෙස් පීඩා, කෙළෙස් දුරු කිරීම්, අනුසස් පැහැදිලි කළා. උපාලි ගෘහපතිගේ සිත පංච නීවරණයෙන් බැහැරවුනා. හිත ප්‍රබෝධමත් වුනා. බුදුහිමියන් ඊළඟට (දුක්ඛං, සමුදයං, නිරෝධං, මගගං) ආර්‍ය්‍ය සත්‍ය පැහැදිලි කළා. ඒ ආසනයේදීම උපාලි ගෘහපතිට දහම් ඇස පහළ වුනා. බුදුහිමිගෙන් අවසරගෙන එතනින් නික්මුනා. ඔහු තම මාලිගාවට පැමිණිය. තම දොරටුපාලයනට පැවසුවේ නිගණ්ඨ ශාසනයේ කෙනෙකු අද පටන් මෙහි පැමිණේද. උපාලි ගෘහපති බුද්ධ ශ්‍රාවක උනාය. මෙහි නොපිවිසෙනු. පිණ්ඩපාතය උවමනානම් දෙමි. බුද්ධ ශ්‍රාවක වූ සිව්වනක් පිරිසට දොර නොවසනු යනුවෙනි.

මේ ප්‍රවෘත්තිය දීඝ තපස්වීට ආරංචි වුනා. ඔහු පැමිණ ඒ බව ප්‍රත්‍යක්ෂ කරගෙන නිගණ්ඨනාතයන්ට ගොස් පැවසුවා ඔහුද ප්‍රත්‍යක්ෂ කර ගැනීමට මම'ම යමියි සිතා මහා නිගණ්ඨ පිරිසක් සමග ගෘහපති මාළිගයට පැමිණියා. දීඝතපස්වීට මෙන්ම දොරටුපාලයන් දොරටු වැහුව. නිගණ්ඨනාත හට කේන්ති ගොස් උපාලි ගෘහපති මුණ ගැසීමට අවශ්‍ය බව කියා ඔහු ගෙන්වා ගත්තා. නිගණ්ඨනාතයන් විසින් ගෘහපතිට දෝෂාරෝපණ කරනව. භවත් ගෞතමයන්ගේ ආවර්තනී මායාවට අසුවුනා නේදැයි කියා.

එවිට ගෘහපති නිගණ්ඨනාත හට කියනව. වහන්ස ! ඒ ආවර්තනී මායාව යහපත්ය. මාගේ ප්‍රිය සහලේ නෑයන්ටද හැම ක්ෂත්‍රියයෝද, හැම බමුණෝද, හැම වෛශ්‍යයෝද, හැම ශුද්‍රයෝද, දෙවියන්, මරුන්, බඹුන්ද ඇතුළු හැම ඔවුනගේ සහ පිරිවරද භවත් ගෞතම බුදුහිමිගේ ආවර්තනී මායාවට හසුවේනම් එය ඔවුන්ගේ බොහෝ කල් හිතසුව පිණිස පවතී. ඒ නිසා බුදුහිමියන්ගේ මායාව මට හොඳයි. එවිට "උමමතෙතාසි තවං ගහපති" උපාලි ඔබ උම්මත්තක වුනා නේද ඇස් දෙක ඇතිව ගිහිං ඇස් දෙකම නැතිකරගත්ත නේද යනුවෙන් චෝදනා කලා. එවිට ඥාණවන්ත උපාලි ගෘහපතිතුමා උපමාවකින් නිගණ්ඨනාත පුත්‍රහට පැහැදිලි කරනව. වහන්ස මට උපමාවක් මතක් වෙනව. එක් නාකි බමුණෙකුට ළපටි බිරිඳක් හිටිය. ඒ බිරිඳට දරුවෙක් ලැබෙන්න හිටිය. බමුණට කියනව ලැබෙන්න ඉන්න දරුවට සෙල්ලම් කරන්න කඩේට ගිහිං වඳුරු පැටියෙක් ගේන්න කිව්ව. වඳුරු පැටියෙක් ගෙනාව. ඊට පස්සෙ කියනව මේ පැටිය පාට කරන කෙනාගේ ළඟට ගෙනියලා පාට කරගෙන එන්න කිව්ව. පාට කරන මිනිහ කියනව මේ වඳුරු පැටියා වටෙන් ටිකක් පාට කරාට පොඩි කරලා අල්ලලා පාට කරන්න බෑ කියලා. කමක් නෑ මගේ බිරිඳ රැවටීමට ඒ තරමට ඇතියි කියා ගෙනාව. අන්න ඒ වගෙ තමයි ස්වාමීණි ඔබේ බණ මෝඩයින්ට පොඩි වර්ණයක් විනා යහපත් වණී කිරීමක් නෙවි. සත්‍යයක් නොවේ.

තව උපමාවක් ගෘහපතිතුමා කියනව. ස්වාමීනි, බමුණෙකුට අලුත් වස්ත්‍රයක් ලැබෙනව. පාට කරන කෙනා ළඟට ගිහිං දෙනව. මෙය වණී ගන්වල දෙන්න කියල එය සාර්ථකව කරනවා. අලුත් නිසා ඉතා හොඳින් වර්ණ ගන්වල අපුල්ලා සකස් කරන්නට හැකිවුනා. ඒ වාගෙ මෙන් අරහත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේගේ ධම්ය මෝඩයන්ට නොව පණ්ඩිතයන්ට යයි පැහැදිලි කරනව.

අන්තිමට නිගණ්ඨනාත පුත්ත කියනව උපාලි ! රජු ඇතුලු සියලු දෙනා දන්නේ ඔබ මගේ ශ්‍රාවකයෙක් කියල දැන් ඇත්ත කියනව. තොප කාගේ ශ්‍රාවකයෙක්ද කියා ගෘහපතිගෙන් විමසනව. ඒ සමගම ගෘහපතිතුමා හිටි ආසනයෙන් නැගිට උතුරු සලුව ඒකාංශ කොට පොරවා බුදුහිමි වසන පැත්තට හැරී වැඳගෙන නිගණ්ඨනාත පුත්‍ර හට කියනව වහන්ස ! එහෙනම් මම යම් කෙනෙකුගේ ශ්‍රාවකයෙක්ද, උන්වහන්සේගේ ගුණ මම කියමි. අසා දැන ගන්න යනුවෙන් කියා ගාථා 10 කින් බුදුරජාණන් වහන්සේගේ ගුණ සියයක් ප්‍රකාශ කරනව. ඒ ප්‍රකාශය කරන්නෙ මහා එඩිතරකමකින්, මහා ප්‍රඥාවකින්, විශ්මිත නිර්මාණශීලීත්වයකින්, අභිමානවත් බුද්ධිමත් මනුෂ්‍යයෙකු ලෙසටයි. තෙරුවන් සරණ ගිය වත්මන් බෞද්ධයාට මේ ගැන බොහෝ දුරට සිතීම ඉතා වැදගත් වෙනව.

මෙසේ උපාලි ගෘහපතිතුමා බුදුගුණ පද සියයක් ප්‍රකාශ කරනව.

01. ධීරසස විගතමොහසස පභිනනඛීලසස විජිත විජයසස,

අනීඝසස සුසමචිතතසස වුදධසීලසස සාධු පඤදඤදසස,

වෙසසනතරසස විමලසස භගවතො තසස සාවකො'හමසමි

මහානුවනක් ඇති හෙයින් ධීර නම් වූ, මොහඳුර දුරලූ හෙයින් විගතමෝහ නම්වූ, කෙලෙස් උල් සිඳලූ හෙයින් පභින්න ඛීල නම්වූ, මාර පරාජය කොට ජයගත් හෙයින් විජිත විජය නම්වූ, කෙලෙස් දුක් නැසූ හෙයින් අනීඝ නම්වූ, දෙව් මිනිසුන් කෙරෙහි සමමෙත් ඇති හෙයින් සුසමචිත්ත නම් වූ, වැඩුනු සිල් ඇති හෙයින් වෘධ සීල නම්වූ, සුන්දර ප්‍රඥාවෙන් යුතු බැවින් සාධු පඤ්ඤ නම්වූ, කෙළෙස් නැමැති දුෂ්කර මග ගෙවූ බැවින් වෙස්සන්තර නම්වූ, නිර්මල පිරිසිදු ගුණ ඇති හෙයින් විමල නම්වූ, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

02. අකථඞකථිසස තුසිතසස වනතලොකාමිසසස මුදිතසස,

කතසමණසස මනුජසස අනතිමසාරීරසස නරසස,

අනොපමසස විරජසස භගවතො තසස සාවකො'හමසමි

සැකය තරණයකොට එතෙර වැඩි හෙයින් අකථංකථී නම්වූ, සතුටු සිත් ඇති හෙයින් තුසිත නම්වූ, කාමගුණ බැහැර කළ හෙයින් වන්තලෝකා මිස වූ, ලොවේ යහපත දැක සතුටු වුන හෙයින් මුදිත නම්වූ, ශ්‍රමණ ගුණ සම්පූර්ණ කළ හෙයින් කතසමණ නම්වූ, උත්තම නරයෙකු වූ හෙයින් මනුජ නම්වූ අවසන් සරීරය දරණ බැවින් අන්තිමසාරීර නම්වූ, උදාර මිනිසෙකු බැවින් නර නම්වූ, උපමා කළ නොහැකි බැවින් අනුපම වූ, කෙළෙස් දුහුවිලි නැති හෙයින් විරජ නම්වූ, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

03. අසංසයසස කුලසස වෙනයිකසස සාරථිවරසස

අනුතතරසස රුචිරධමමසස නිකකඞඛකසස පභාසකරසස

මානච්ඡිදස්ස වීරස්ස භගවතො තස්ස සාවකො'හමස්මි

සංකා නැති සිත් ඇති හෙයින් අසංසය නම්වූ, හැමදෙනාටම යහපත සාදාදෙන හෙයින් කුල නම්වූ ලෝකසත්වයා හික්මවන හෙයින් වේනයික නම්වූ දහමෙහි මැනවින් හික්මවන හෙයින් සාරථිවර නම්වූ, උත්තම ගුණ ඇති හෙයින් අනුත්තර නම්වූ, පිරිසිදු දහම් ඇති හෙයින් රුචිරධම්ම නම්වූ, නිසැක ගුණ ඇති හෙයින් නිශ්ශඞ්ඛ නම්වූ, නුවණින් ලොව එළිය කරන හෙයින් ඕභාසකර නම්වූ, සිඳින ලද මාන ඇති හෙයින් මානච්ඡිද නම්වූ, මහා වීර ගුණයන්ගෙන් පිරිපුන් හෙයින් වීර නම්වූ, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

04. නිසභස්ස අප්පමෙය්‍යස්ස ගම්භීරස්ස මොනපත්තස්ස

ඛෙමඞ්කරස්ස දෙවස්ස ධම්මට්ඨස්ස සංවුතත්තස්ස

සඞ්ගාතිගස්ස මුත්තස්ස භගවතො තස්ස සාවකො'හමස්මි

අසම ගුණ ඇති හෙයින් නිසභ නම්වූ, ප්‍රමාණ කළ නොහැකි ගුණ ඇති හෙයින් අප්‍රමේය වූ, ගැඹුරු නුවණින් යුතු බැවින් ගම්භීර වූ, මුනිවර දහමට පත්වූ හෙයින් මෝන පත්ත නම්වූ, බියරහිත ගුණයෙන් යුතු බැවින් ඛේමංකර නම්වූ, ලොවෙහි දෙවියන් බඳු හෙයින් දේව නම්වූ, ධර්මයෙහි පිහිටි හෙයින් ධම්මට්ඨ නම්වූ සංවර සිත් ඇති හෙයින් සංවුතත්ත නම්වූ, කෙළෙස් මළ ඉක්මවූ හෙයින් සංඝාතික නම්වූ, දුකින් මිදුනු හෙයින් මුත්ත නම්වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

05. නාගස්ස පන්තසෙනස්ස ඛීණසංයොජනස්ස මුත්තස්ස

පටිමන්තකස්ස ධොනස්ස පන්නද්ධජස්ස වීතරාගස්ස

දන්තස්ස නිප්පපඤ්චස්ස භගවතො තස්ස සාවකො'හමස්මි

මහාහස්තිරාජයෙකු බඳු හෙයින් නාග නම්වූ, ප්‍රාන්ත වූ ඈත වනයේ සේනාසනවූ හෙයින් පන්තසේන නම්වූ, සංයෝජන කෙලෙස් බැඳීම් ගෙවාදැමූ බැවින් ඛීණසංයෝජන නම්වූ, කෙලෙසුන්ගෙන් නිදහස් වූ හෙයින් මුක්ත නම්වූ, නුවණින් යුතු වචන ඇති හෙයින් පටිමංතක නම්වූ, කෙලෙස් ධෝවනය කොට හැරී හෙයින් ධෝන නම්වූ, මාන නැමති ධජය බිම පතිත කළ හෙයින් පන්නද්ධජ නම්වූ, රාගයෙන් වෙන් වූ හෙයින් වීතරාග නම්වූ, දමනය වූ හෙයින් දන්ත නම්වූ, අප්‍රමාදීව කෙලෙස් නැතිකල හෙයින් නිප්පපඤ්ච නම්වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

06. ඉසිසත්තමස්ස අකුහස්ස තෙවිජ්ජස්ස බ්‍රහ්මපත්තස්ස

නහාතකස්ස පදකස්ස පස්සද්ධස්ස විදිතවෙදස්ස

පුරින්දදස්ස සක්කස්ස භගවතො තස්ස සාවකො'හමස්මි

සත්බුදුවරුන් අතර සත්වැනි මහා ඉසිවරයා වූ හෙයින් ඉසිසත්ත නම්වූ, කුහක ගති නැති හෙයින් අකුහ නම්වූ, ත්‍රිවිද්‍යාව ලත් හෙයින් තේවිජ්ජ නම්වූ, ශ්‍රේෂ්ඨත්වයට පත්වූ හෙයින් බ්‍රහ්මපත්ත නම්වූ, කෙළෙස් මළ සෝදා හළ හෙයින් නහාතක නම්වූ, දහම් ගාථා පද මැනවින් වදාළ හෙයින් පදක නම්වූ, සැහැල්ලු කරගත් ගත සිත ඇති හෙයින් පස්සද්ධ නම්වූ, දුටු දහම් ඇති හෙයින් විදිත වේද නම්වූ, හැමට පළමුව ධම්දානයට දායක වූ හෙයින් පුරින්දද නම්වූ, සියළු ගුණයන්ගේ දක්‍ෂභාවය ඇති හෙයින් සක්ක නම්වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

07. අරියසස භාවිතතතසස පතති පතත සස වෙයයාකරණසස

සතීමතො විපසසිසස අනභිනතසස නොඅපනතසස

අනෙජසස වසිපපතතසස භගවතො තසස සාවකො'හමසමි

ආර්‍ය්‍ය වූ ගුණ ඇති හෙයින් අරිය නම්වූ, වර්ධනය කරන ලද සිත් ඇති හෙයින් භාවිතත්ත නම්වූ, පැමිණිය යුතු ගුණයට පැමිණි හෙයින් පත්ති පත්ත නම්වූ, දහම හොඳින් විස්තර කොට අර්ථ දක්වන හෙයින් වෙය්‍යාකරණ නම්වූ, මනා සිහිනුවණකින් හෙබියාවූ හෙයින් සතිමා නම්වූ, විදර්ශක නුවණින් ලොව දක්නා හෙයින් විපස්සී නම්වූ, රහත් ගුණයෙන් යුතුවූ හෙයින් අනභිනත නම්වූ, සියළු දුර්ගුණ බැහැර කළ හෙයින් අපනත නම්වූ, තණ්හා නැති හෙවින් අනේජ නම්වූ, වසඟකළ සිත් ඇති හෙයින් වසිප්පත්ත නම්වූ, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

08. සමමගගතසස කධායිසස අනනුගතනතරසස සුදධසස

අසිතසස අපපහීනසස පවිවිතතසස අගගපතතසස

තිණණසස තාරයනතසස භගවතො තසස සාවකො'හමසමි

යහපත් මග වැඩි හෙයින් සමග්ගත නම්වූ, ධ්‍යාන සුවයෙන් යුතුවූ හෙයින් කධායී නම්වූ, කෙලෙස් හා මිශ්‍ර නොවූ සිත් ඇති හෙයින් අනනුගතන්තර නම්වූ, පිරිසිදු සිත් ඇති හෙයින් ශුද්ධ නම්වූ, කෙලෙස් හා බද්ධ නොවූ හෙයින් අසිත නම්වූ, නැති නොවන තිරසාර ගුණ ඇති හෙයින් අප්පහීන නම්වූ, හුදකලාව ප්‍රිය කරන සිතින් යුතු වූ හෙයින් පවිවිත්ත නම්වූ, තුන්ලෝකාග්‍ර වූ හෙයින් අග්ගපත්ත නම්වූ, සසර චතුරෝඝ තරණය කර සසර එතෙර වූ හෙයින් තිණ්ණ නම්වූ, අනුන්ද එතෙර කරවන හෙයින් තාරයන්ත නම්වූ, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

09. සනනසස භූරිපඤඤසස මහාපඤඤසස වීතලොභසස

තථාගතසස සුගතසස අපපටිපුගගලසස අසමසස

විසාරදසස නිපුණසස භගවතො තසස සාවකො'හමසමි

ශාන්ත වූ විහරණයෙන් යුතු හෙයින් සන්ත නම්වූ, පොළොව ලෙසට පැතිරී ප්‍රඥා ඇති හෙයින් භූරිපඤ්ඤ නම්වූ, මහා ප්‍රඥාවෙන් යුතුවූ හෙයින් මහාපඤ්ඤ නම්වූ, ලෝභය දුරුවී ඇති හෙයින්

වීතලෝභ නම්වූ, සත්‍යයට පත්වූ හෙයින් තථාගත නම්වූ සුන්දර ගමනක් වැඩි හෙයින් සුගත නම්වූ, ඒහා සමකල හැකි කෙනෙකු ලොව නැති හෙයින් අප්පටිපුග්ගල නම්වූ, ඒ හා සමකල හැකි නොවන ලෙසින් අසම නම් වූ, අභීතව ප්‍රකාශ කළ හැකි ඥාණයෙන් යුතු වූ හෙයින් විසාරද නම්වූ, සියුම් වූ නුවණින් යුතු වූ හෙයින් නිපුණ නම්වූ, ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

10. තණහචඡිදසස බුදධසස වීතධූමසස අනුපලිතතසස

ආහුණෙය්‍යසස යකඛසස උතතමපුගගලසස අතුලසස

මහතො යසගගපතතසස භගවතො තසස සාවකො'හමසමි

තණ්හාව සිඳලූ හෙයින් තණ්හච්ඡිද නම්වූ, චතුරාර්‍ය්‍ය සත්‍ය අවබෝධ කළ හෙයින් බුද්ධ නම්වූ, කෙළෙස් දුම් බැහැර කළ හෙයින් වීතධූම නම්වූ, කෙළෙස් මඩ නොතැවරී සිටිනා බැවින් අනුපලිත්ත නම්වූ, සිව්පස ආදී පූජා ලැබීමට සුදුසු වූ හෙයින් ආහුණෙය්‍ය නම්වූ ආනුභාවයෙන් ශ්‍රේෂ්ඨ උත්තම වූ හෙයින් යක්ඛ නම්වූ, හැමට වඩා උත්තම පුද්ගලයෙකු වූ හෙයින් උත්තමපුග්ගල නම්වූ, අසාමාන්‍ය වූ සමකල නොහැකි වූ ගුණ ඇති හෙයින් අතුල නම්වූ, මහාගුණ ඇති හෙයින් මහා නම්වූ, මහත්වූ යසස් ශ්‍රීයෙහි අගතැන්පත් වූ හෙයින් යසග්ග පත්ත නම්වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මම ශ්‍රාවක වෙමි.

මේ අභිවන්දන ප්‍රකාශය අසා සිටි නිගණ්ඨනාතපුත්ත විමතියට හෙවත් පුදුමයට පත්වී අහනව ගෘහපතිය ! ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ මේ කියපු ගුණ තොප මෙතරම් ඉක්මනට කවර කලෙක ඒකරාශී කළාද? එවිට උපාලි ගෘහපතිතුමා කියනව. වහන්ස ! ඒක මේ වගෙ කාරණයක්. දක්ෂ මල් දම් ගොතන කෙනෙකුට විවිධ වර්ණ මල් රාශියක් ලැබෙනව. ඒ මල් ගැලපෙන විදියට අමුණා ලස්සන මාලා ගොතනව. ඒවාගේ ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්සේ නොයෙක් සිය ගුණයෙන් යුතුයි. එසේ වර්ණනා කළ යුතු ගුණ ඇති උත්තමයකුගේ ගුණ බුද්ධිමත් වූ කවරෙක් වණීනා නොකර ඉඳීවිද?

ඒ ඉවසාගත නොහැකි වූ නිගණ්ඨනාත පුත්ත ශාස්තෘවරයාගේ මුඛයෙන් හුණුවූ ලේ වමනෙ කොට එයින්ම රෝගාතුර වූ බව සූත්‍රයේ දැක්වෙනව.

මේ සූත්‍රය පිළිබඳ හොඳ විවරණයක් දැන් ඔබට දැනගන්න ලැබුන. බුදුරජාණන් වහන්සේ ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයට පැමිණ දේශනා කළේ විශ්ව සාධාරණ දහමකි. ලෝකයේ ඕනෑම ආගමක් දරණ කෙනෙකුට ඕනෑම ජාතියක කෙනෙකුට සාධාරණ පරම සත්‍යයකි. නිගණ්ඨ දහම තුල කාය දණ්ඩය යනුවෙන් උගන්වන්නෙ කම් සිදුවීමට කම් පැවැත්මට කය මුල් වෙනවා යන මතයයි. වචී කම් සහ මනෝ කම් ඉතා ලාමක දෙයක් හැටියටයි සැලකුවෙ. කාය කම් මහා බරපතල දෙයක් හැටියටයි සැලකුවෙ. බුදුරජාණන් වහන්සේ එදා දඹදිව පහළ වන විට මෙවැනි ආගම් විශාල ප්‍රමාණයක් තිබිණ. ඒවාට ඒකරාශීවූ මනුෂ්‍යයෝ අතරින් නිගණ්ඨනාත දහමට අවනත වූ පිරිසද ඉතා විශාලය. බුදුරජාණන් වහන්සේ උපාලි ගෘහපතිතුමාගේ සිත නිවැරදි පැත්තට හැරෙව්වා. අඳුර දුරු කළා. මේ ධම්තාවය මුලු බුද්ධ දේශණාව පුරාම පැතිරී පවතින්නක්. ඒ පිළිබඳව ධමම පදයේ පළමු ගාථාව සහ දෙවෙනි ගාථාව තුලින්ද තහවුරු වේ. කම්යක් කිරීමට සහ කම්යන්ගේ පැවැත්මට මනස හෙවත් සිත මුල් වන බව එහි පළමු ගාථාවෙන් "මනො පුබබංගමා ධමමා" යනාදී වශයෙන් වදාරා.

අකුසල දහමයනට සිත මුල්වේ. කිලිටු වූ සිතින් අකුසල් කළ තැනැත්තා පසුපස්සේ දුක ලුහුබඳී යනුවෙන් චක්ඛුපාල මහරහතන් වහන්සේ අරබයා දේශනා කොට ඇත. දෙවෙනි ගාථාවෙන් "කුසල දහමක් සඳහා සිත මුල්වේ. ප්‍රසන්න සිතින් පින්කල තැනැත්තා පසු පස්සේ සැප ලුහුබඳී." යනුවෙන් මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයන් අරබයා දේශනා කොට ඇත. මේ ගාථා ධර්ම දෙකෙන්ම ඉගැන්වෙන්නේ පූර්වංගම වන්නේ මනස බවයි. එසේ සිත පෙරටු වී පළමු අංගය වී නොසන්සුන් සිත මුල්වී කයින්, වචනයෙන්, සිතින්, තුන්දොරින් කිරීම්, කෙරුම්, සිතුම් සිදුවේනම් ඒවා අකුසල්ය. සිත පළමු අංගය වී සන්සුන් ප්‍රසන්න සිතින් කිරීම්, කෙරුම් සිතුම් සිදුවේ නම් ඒ සියල්ල කුසල්ය.

මෙසේ ලෝකනාථ වූ භාග්‍යවතුන් වහන්සේ සර්වඥතා ඥාණයෙන් වදාරා ඇතත් ඇතැමුන් පිනකට දහමකට මිල මුදලක් වියදම් කලා නම් තම මානය පෙරටුවන නිසා ලියා කියා ප්‍රදර්ශනය කළේ නැතිනම් සිත දූෂිත කරගනී. එයින් හැඟෙනුයේ අතින් අත් හැරියද සිතින් අත් නොහැරි බවයි. සිතෙන් අත් නොහරිනතුරු සිතට දුක් ගෙනදේ. එයින් කර්ම රැස්වේ. අත්හරින තරමට සැනසීම ඇතිවේ. දුක් අඩුවේ. පිනකට දහමකට මුදල් වැයකල ඇත්තන්ගේ නාමලේඛණ ඉදිරිපත් කිරීම බලවත් වරදක් සේ මෙයින් තරයේ නොකියමි. බෞද්ධ ධර්මයට අනුව චේතනාව මූලික වන බව අප තේරුම් ගත යුතුය. පිනට වියදම් කළ මුදලට වඩා නාමපුවරු ප්‍රදර්ශනයට දිරන යකඩ සහ බදාම කඩදාසි ආදියට වියදම් කරනුයේ මනස මුල්වීම පින සිදුවීමට හේතු නොවනු ඇතැයි සැකයෙන් දකින ඇත්තන්ටය.

"චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති, කායෙන වාචාය මනසා". මහණෙනි, මම චේතනාව කර්මය යයි කියමි. සිත, කය, වචනය යන තිදොරින් සිතා මතා කර්ම රැස් කෙරේ." යනුවෙන් තහවුරු කොට වදාළහ.

මේ විශ්ව සාධාරණ දහම තේරුම් ගැනීමට පෙර බුදුරජාණන් වහන්සේ පිළිබඳව පූර්ව අංගය වන සිත මූලික වූ පැහැදීම ඇති කර ගත යුතුයි. එසේ නැතහොත් නිගණ්ඨනාත පුත්තට මෙන් දීඝ තපස්වීට මෙන් පසුව සිත පැහැදුනද, මුලදී වරදවාගත් උපාලි ගෘහපතිට මෙන් මානය පෙර